# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| **නිකුත් කළේ** | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2023.01.17 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2022 දෙසැම්බර්

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවලට අනුව 2022 දෙසැම්බර් මාසයේදී, සේවා ක්‍රියාකාරකම්වල වර්ධනයක් දක්නට ලැබුණු අතර, නිෂ්පාදන ක්‍රියාකාරකම්වල පසුගාමීබව තවදුරටත් දක්නට ලැබුණි.**

**නිෂ්පාදන ක්‍රියාකාරකම්හි අඛණ්ඩ පසුබෑමක් පෙන්නුම් කරමින්, නිෂ්පාදන අංශයේ ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය 2022 දෙසැම්බර් මාසයේ දී 44.8ක අගයක් වාර්තා කරණ ලදී.** මෙම පසුබෑම කෙරෙහි ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය හැර අනෙකුත් සියලුම උප-දර්ශකයන්ගේ පහත වැටීම හේතු විය.


නව ඇණවුම් සහ නිෂ්පාදන පහත වැටීම කෙරෙහි ප්‍රධාන වශයෙන් රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන අංශයේ දක්නට ලැබුණු පසුබෑම හේතු විය. උත්සව සමය හේතුවෙන් පැවති නිවාඩු සහ ප්‍රධාන අපනයන ගමනාන්තයන්හි පවතින ආර්ථික මන්දගාමීත්වය විදේශීය ඉල්ලුම අඩු වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු විය. ඉහළ යෙදවුම් පිරිවැය සහ අමුද්‍රව්‍ය ආනයනය සඳහා අවශ්‍ය විදේශ විනිමය හිඟය වැනි සැපයුම් අංශයේ බාධාවන් තවදුරටත් පැවතියද, පාරිභෝගිකයන්ගේ මිලදී ගැනීමේ හැකියාව අඩු වීම හේතුවෙන් වූ ඉල්ලුමේ පහල වැටීම, නිෂ්පාදනය ඉහළ දැමීමට පැවති ප්‍රධානම බාධකය වූ බව නිෂ්පාදකයින් සඳහන් කරන ලදී. තවද, නව ඇණවුම් සහ නිෂ්පාදනයෙහි දක්නට ලැබුණු පහත වැටීමට සමගාමීව සේවා නියුක්තිය සහ තොග මිල දී ගැනුම් ද පහත වැටුණි. මේ අතර, පසුගිය මාසයට සාපේක්ෂව 2022 දෙසැම්බර් මාසයේ දී ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය වැඩි විය.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**44.8**

**2022 නොවැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 2.7 ක ඉහළ යෑමකි**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචල්‍යය | නොවැ. | දෙසැ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **42.1** | **44.8** | **+** | අඩු වේගයකින් පහළ යෑමක් |
| **උපදර්ශක** | | | | |
| නව ඇණවුම් | 38.0 | 45.5 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| නිෂ්පාදන | 35.5 | 40.5 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 48.0 | 44.5 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 43.9 | 41.9 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 52.5 | 53.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ආර්ථික කටයුතු වර්ධනය වීමක් අපේක්ෂා කරමින් 2022 දෙසැම්බර් මාසයේ දී ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන අංශයෙහි ක්‍රියාකාරකම් සඳහා වන අපේක්ෂාවන් ඉහළ යන ලදී.

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2022 නොවැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.2කින් පහළ යමින් 2022 දෙසැම්බර් මාසයේ දී 48.6ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

පසුගිය මාසයට සාපේක්ෂව 2022 දෙසැම්බර් මාසයේ දී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ඉන්දියාවේ වැඩි වේගයකින් ද රුසියාවේ අඩු වේගයකින් ද වර්ධනය විය. එසේ වුවද, යුරෝපා කලාපය, එක්සත් රාජධානිය, එක්සත් ජනපදය, චීනය සහ සිංගප්පූරුව යන රටවල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පසුගිය මාසයට සාපේක්ෂව 2022 දෙසැම්බර් මාසයේ දී පහළ යන ලදී.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2023 ජනවාරි 14 වන දිනට*

---

[1] *එස්&පී ග්ලෝබල්* (S&P Global) *ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**51.6**

**2022 නොවැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 2.6ක ඉහළ යෑමකි.**


**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, අඛණ්ඩව මාස දෙකක් පහත වැටීමෙන් පසුව 2022 දෙසැම්බර් මාසයේ දී 51.6ක දර්ශක අගයක් වාර්තා කරමින් වර්ධන කලාපයට නැවත ලඟා විය.** මෙම ඉහළ යෑම සඳහා නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්හි සිදු වූ වර්ධනය හේතු විය. කෙසේ වෙතත්, සේවා නියුක්තිය සහ නිමකිරීමට නියමිත කාර්යයන් අඛණ්ඩව පහත වැටුණි.

ප්‍රධාන වශයෙන්, අනෙකුත් පෞද්ගලික සේවා, නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා සහ රක්ෂණ යන උප අංශවල දක්නට ලැබුණු ඉහළ යෑමත් සමඟ, 2022 නොවැම්බර් මාසයට සාපේක්ෂව 2022 දෙසැම්බර් මාසයේ දී නව ව්‍යාපාර අඩු වේගයකින් වර්ධනය විය.

සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල ඉහළ යෑමේ ප්‍රවණතාව 2022 දෙසැම්බර් මාසයේ දීත් අඛණ්ඩව පැවතුනි. සංචාරක පැමිණීම්වල වැඩිවීමට සමගාමීව, අනෙකුත් පෞද්ගලික සේවා සහ නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා යන උප අංශවලට අදාළ ව්‍යාපාර ක්‍රියාකාරකම් සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. තවද, රක්ෂණ, විදුලි සංදේශ සහ මූල්‍ය සේවා යන උප අංශ ද පෙර මාසයට සාපේක්ෂව යම් වර්ධනයක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, අඛණ්ඩව පවතින ජීවන වියදම් ඉහළ යෑම හා සම්බන්ධ දුෂ්කරතා සහ ඇතැම් භාණ්ඩවල හිඟය මධ්‍යයේ තොග හා සිල්ලර වෙළඳාම උප අංශයට අදාළ ව්‍යාපාර ක්‍රියාකාරකම් තවදුරටත් පහත වැටුණි.

සේවයෙන් ඉවත්වීම්, රැකියා සඳහා විදේශගත වීම් සහ විශ්‍රාම ගැනීම් දිගටම පැවතියද, සෘතුමය බඳවා ගැනීම් හේතුවෙන් දෙසැම්බර් මාසයේ දී සේවා නියුක්තිය අඩු වේගයකින් පහළ ගියේය. මේ අතර, නිමකිරීමට නියමිත කාර්යයන්ද අඩු වේගයකින් පහළ ගියේය.

සේවා අංශයෙහි
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචල්‍යය | නොවැ. | දෙසැ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **49.0** | **51.6** | **+** | **පහළ යෑමක සිට ඉහළ යෑමක්** |
| | | <u>උපදර්ශක</u> | | |
| නව ව්‍යාපාර | 53.5 | 52.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 53.0 | 54.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 37.4 | 45.5 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 41.8 | 47.4 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 59.2 | 59.0 | + | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් තවදුරටත් වර්ධනය වූ අතර, මේ සඳහා, ආර්ථික තත්ත්වයේ වැඩිදියුණුවීම පිළිබඳ සුබවාදී බලාපොරොත්තු සහ එළඹෙන කාලය සංචාරක පැමිණීම් බහුල වශයෙන් සිදුවන කාලපරිච්ඡේදයක් වීම හේතු විය. කෙසේ වෙතත්, සමහර ප්‍රතිචාර දක්වන්නන් විසින් ඉල්ලුම කෙරෙහි බදු ඉහළ දැමීමෙන් ඇතිවන බලපෑම පිළිබඳව අදහස් පළ කරන ලදී.

## ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි පහළ යෑමක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2022 දෙසැම්බර් මාසයේ දී 2022 නොවැම්බර් මාසයේ පැවති 48.1 අගයේම නොවෙනස්ව පැවතුනි

ඉන්දියාව සහ ජපානය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අනුව එම රටවල සේවා අංශය පසුගිය මාසයට සාපේක්ෂව 2022 දෙසැම්බර් මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කළ අතර, චීනය, එක්සත් රාජධානිය සහ ඇමරිකා එක්සත් ජනපදය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අනුව එම රටවල සේවා ක්‍රියාකාරකම්වල පහළ යෑමක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2023 ජනවාරි 14 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.